# ශ්‍රී ලංකා - ජර්මානු පුහුණු ආයතනය

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

german cooperation
DEUTSCHE ZUSAMMENARBEIT

**2021 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුලත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.**

1. **(අ) වයස :** 2021.04.30 වැනි දිනට අවුරුදු 16 ත් 24 ත් අතර විය යුතුය.

**(ආ) අධ්‍යාපන සුදුසුකම්:**
අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/දෙමල භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම

හෝ

ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම

හෝ

අදාල ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 සහතිකය.

**විශේෂ කුෂලතා:**
විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන සෙක්ත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පලාත් මට්ටමේ තරග වලින් ප්‍රථම ස්ථාන 3 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ඉහත සෙක්ත්‍රයන්ගෙන් ජාතික මට්ටමේ තරග වලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහල ජයග්‍රහණයක් ලබා ඇති අය ඉහත (ආ) සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්ය .

(ඇ) සැ.යු. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග වසර 02 ක් හෝ වැඩි කාලයකට දැනට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකල යුතුය.

2. **පාඨමාලා මාධ්‍යය**
මෙහි සියලුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා ඉංග්‍රීසි දැනුම පාඨමාලා හැදෑරීමට ප්‍රමාණවත් වේ. අභ්‍යාසලාභීන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩි දියුණු කිරීම සඳහා විශේෂ ඉංග්‍රීසි පන්ති පවත්වනු ලැබේ.

3. **ඇතුලත් කර ගැනීමේ පරීක්ෂණය**
අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.
(අ) පවත්වන මාධ්‍යය: සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි
(ආ) විභාග මධ්‍යස්ථාන:
අයදුම්පතේ දක්වා ඇති පරිදි ඇතුළත් කිරීම සඳහා ලිඛිත විභාගයක් කිලිනොච්චි, කොළඹ, මහනුවර සහ මඩකලපුව යන මධ්‍යස්ථානවල පවත්වනු ලැබේ.

විශේෂිත මධ්‍යස්ථානවල ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති නම්, අපේක්ෂකයින්ගේ අභිමතය පරිදි එවැනි අයදුම්පත් ලබා දීමෙන් මධ්‍යස්ථාන වෙනස් කිරීමේ අයිතිය කළමණාකාරිත්වයට ඇති බව කරුණාවෙන් සලකන්න.

**විභාගයට අදාල විෂයයන්:**
විභාගය ගණිතය, සාමාන්‍ය දැනුම, බුද්ධි පරීක්ෂණය, තාක්ෂණික දැනුම, ඉංග්‍රීසි දැනුම සහ තාක්ෂණික ඇඳීම් පදනම් කරගත් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

4. **විභාග ගාස්තු:**
විභාග ගාස්තු වශයෙන් අයදුම්කරුවන් රුපියල් පන්සියයක් (රු.500/-) ගෙවිය යුතුය. බැංකුවේ ගෙවීම් වවුචරය අයදුම්පතට අමුණා තිබිය යුතුය. අයදුම්පත බැංකුවේ ගෙවන වවුචරය සමග ඉදිරිපත් කළ යුතුය.

**ගෙවීම:** කිලිනොච්චි ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 048-1-001-8-0086726 වෙත බැර කරන ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ ගණකාධිකාරීවරයාට හෝ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. අක්‍රිය හෝ මකා දැමූ වවුචර ගෙවීම පිළිගනු නොලැබේ. වටිනාකමට ණය වවුචරයක් නොමැති අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගයට පෙනී නොසිටින අපේක්ෂකයින්ට හෝ වෙනත් හේතුවක් නිසා අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමෙන් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. **මූලික තෝරාගැනීම:**
ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රමුඛතා පදනම මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේදී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම SLGTI කළමණාකාරීත්වය විසින් තීරණය කරනු ලැබේ. වරප්‍රසාද (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ)

6. **අවසන් තෝරා ගැනීම**
සම්මුඛ පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගත් අය අවසාන තේරීම සඳහා සලකා බලනු ලැබේ. විෂය බාහිර ක්‍රියාකාරකම් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

තෝරාගත් අපේක්ෂකයින්ට වෛද්‍ය පරීක්ෂණයකට යාමට සිදු වන අතර වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අය අත්හිටවනු ලැබේ.

7. **පුහුණු පාඨමාලා (NVQ මට්ටම 4)**

| අනු අංකය | පාඨමාලා | කාලසීමාව |
|---|---|---|
| 1. | මෝටර් කාර්මික ශිල්පය | අවුරුදු 02 |
| 2. | ස්වයංක්‍රිය විදුලි ශිල්පය | අවුරුදු 02 |
| 3. | බල විදුලි ශිල්පය | අවුරුදු 02 |
| 4. | වායු සමීකරණ /ශීතකරණ ශිල්පය | අවුරුදු 02 |
| 5. | ඉලෙක්ට්‍රොනික් ශිල්පය | අවුරුදු 02 |
| 6. | යාන්ත්‍රණ ශිල්පය | අවුරුදු 02 |
| 7. | පෑස්සුම් ශිල්පය | අවුරුදු 02 |
| 8. | බේකරි | අවුරුදු 02 |
| 9. | රසායනාගාර තාක්ෂණ ශිල්පය | අවුරුදු 02 |
| 10. | සහකාර ප්‍රමාණ සමීක්ෂක | අවුරුදු 02 |
| 11. | කෙටුම්පත්කරු | අවුරුදු 02 |
| 12. | ඉදිකිරීම් සුපරීක්ෂක | අවුරුදු 02 |
| 13. | මැනුම් ක්ෂේත්‍ර සහකාර | අවුරුදු 02 |
| 14. | තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පය | අවුරුදු 02 |
| 15. | පරිගණක දෘඩාංග සහ ජාල තාක්ෂණ ශිල්පය | අවුරුදු 02 |

මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙනුයේ මූලික පුහුණු පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තිය තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවයන් අනුවය.

8. **ගිවිසුම් අත්සන් කිරීම:**
ආයතනය පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාලව අවුරුදු දෙකක් (02) හෝ පාඨමාලාව සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග ගිවිසුමකට එළඹිය යුතුය.

9. **අයදුම්පත්**
www.slgti.com වෙබ් අඩවියේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව තම අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර මගින් අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන සහතික වල ඡායා පිටපත් ද අමුණා එවීම අනිවාර්ය වේ.
(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික
(ඇ) විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන පළාත් / ජාතික මට්ටමේ තරග සහතිකය ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2021 යනුවෙන් සඳහන් කල යුතුය.

**අයදුම්පත් ලබා ගැනීම**

- අයදුම්පත් www.slgti.com දරන ආයතනීය වෙබ් අඩවියෙන්
- ආයතනයට පැමිණීමෙන්

10. **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය:**
අයදුම්පත් 2021.04.30 වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ කළමණාකාර පරිපාලන හා මානව සම්පත් වෙත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
අධ්‍යක්ෂක / විදුහල්පති, ලංකා ජර්මානු පුහුණු ආයතනය, අරිවියල් නගර්, කිලිනොච්චි.

11. **විභාග ප්‍රවේශපත්‍ර**
සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාල විභාග ප්‍රවේශපත්‍ර **2021.05.17** දින වනවිට ලැබීමට සලස්වන අතර ඒ වනවිටත් ප්‍රවේශපත්‍ර නොලැබුණු අයදුම්කරුවන් වේනම් එදින සිට දින 14 ක් ඇතුලත පහත දුරකථන අංකයෙන් විමසිය යුතුය.

"නිපුණතා සිසු සවිය" යෝජනා ක්‍රමය යටතේ පුහුණුවන්නන්ගේ පැමිණීම අනුව මසකට රුපියල් හාරදහසක දීමනාවක් ගෙවනු ලැබේ.
වෙනත් පළාත්වලින් පැමිණෙන අභ්‍යාසලාභීන්ට නවාතැන් පහසුකම් සපයනු ලැබේ.

**අධ්‍යක්ෂක / විදුහල්පති,**
**ශ්‍රී ලංකා - ජර්මානු පුහුණු ආයතන,**
**අරිවියල් නගර්, කිලිනොච්චි.**
**දුරකථන - 0214927799**

SLGTI SRI LANKA GERMAN TRAINING INSTITUTE
KILINOCHCHI

giz Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH